දුවේ පුතේ ....

- **ඡේදය කිහිපවරක් කියවන්න.**

කන්ද උඩින් හිරු පායයි. ගස්වල මල් පිපෙයි. ඒ මල් සුවඳ පරිසරය පුරා ම පැතිරෙයි. රැයේ පිපුණු සේපාලිකා මල් බිමට වැටෙයි.කපුටෝ කාක් කාක් කියමින් කෑගසති. නිදා සිටි කුරුල්ලෝ කීච් බීච් ගාමින් කෑම සොයා යති. එළදෙන උම්බෑ කියමින් කෑගසයි. වසුපැටවා කිරි බී වත්ත පහළ සෙල්ලම් කරයි.අපේ වත්ත පහළ එළවළු කොටුවක් තිබේ. උදේ තාත්තා වත්ත පහළට යයි. එළවළු කොටුවේ එළවළු කඩයි. ඉන් පසු තාත්තා වළවල් හාරා අලුත් පාත්තියක් සාදයි. තවාන් කර ඇති පැළ ඒ පාත්තියේ සිටුවයි.අම්මාත් එළවළු කොටුව දෙසට යයි. එළවළු කොටුව පුරා සිසිල් සුළඟක් හමයි. එයින් ගතට සීතලක් දැනෙයි. තාත්තා කැඩූ එළවළු, අම්මා කූඩයට දමයි. අම්මා ගොටුකොළ කඩා මිටි බඳියි. එළවළු සහ ගොටුකොළ මාමාගේ කඩයට දෙයි. මාමා ඒවා විකුණයි.

**ඡේදයේ ඇසුරින් පහත වාක්‍ය කියවන්න.**

කන්ද උඩින් හිරු පායයි.

ගස්වල මල් පිපෙයි.

සේපාලිකා මල් බිමට වැටෙයි.

සිසිල් සුළඟක් හමයි.

මගේ ගතට සීතලක් දැනෙයි

එහි දී

**පායයි, පිපෙයි, පැතිරෙයි, වැටෙයි, හමයි, දැනෙයි**

යන ක්‍රියා පදවලින් ඉබේ සිදුවන කටයුතු යෙදී ඇතිබව පෙනේ.

**ඡේදයේ ඇතුළත් වාක්‍ය කියවන්න.**

කුරුල්ලෝ කෑම සොයා යති.

එළදෙන උම්බෑ කියමින් කෑගසයි.

වසුපැටවා සෙල්ලම් කරයි.

තාත්තා වත්ත පහළට යයි.

තාත්තා එළවළු පැල සිටුවයි.

අම්මා එළවළු කූඩයට දමයි.

**"කෑගසති, යති, කරයි, යයි, සිටුවයි, දමයි"**

යන ක්‍රියා පදවලින් කවුරුන් හෝ කරන වැඩක් හැඟවෙන බව පෙනේ.

කපුටෝ කෑගසති.
කුරුල්ලෝ කෑම සොයා යති.
කන්ද උඩින් හිරු පායයි.
ගස්වල මල් පිපෙයි.

එම වාක්‍ය සිසුන් සමඟ කිහිප වරක් කියවන්න

**වාක්‍යවල කවුරුන් හෝ කරන වැඩ ඇතුළත්**

**වාක්‍ය සහ ඉබේ සිදු වන කටයුතු ඇතුළත් වාක්‍ය** ඇති බව දැන් ඔබ දන්නවා ඇති.

ඒ අනුව කවුරුන් හෝ කරන වැඩ සහ ඉබේ සිදු වන කටයුතු **ක්‍රියා** ලෙසත්, ඒ හා සම්බන්ධ පද '**ක්‍රියා පද**' ලෙසත් හඳුන්වාවා දෙනු ලැබේ.

ඔබත් මෙවන් ක්‍රියා පද ඇතුලත් වාක්‍ය 10 ක් ගොඩ නගන්න.

..................................................................................................................................................
..................................................................................................................................................
..................................................................................................................................................
..................................................................................................................................................
..................................................................................................................................................
..................................................................................................................................................
..................................................................................................................................................
..................................................................................................................................................
..................................................................................................................................................
..................................................................................................................................................
..................................................................................................................................................
..................................................................................................................................................
..................................................................................................................................................
..................................................................................................................................................
..................................................................................................................................................